**බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 - 2024**

**-----------------------------------------------------------------**

## 1. විගණන මතය

**1.1** බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ මතයන් ලබා දී තිබුණ අතර, ඊට හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වුවද බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී කටයුතු කරන බව. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 40 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් එහි ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේදී පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය තෝරාගත යුතු අතර එම ප්‍රතිපත්තිය දේපළ පිරියත හා උපකරණ පන්තිය සඳහාම ව්‍යවහාර කළයුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 31 හි ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් තැබීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ගිණුම්ගත කළයුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 11 ක් සතු ගොඩනැගිලි 18 ක, ඉඩම් 07 ක සහ වෙනත් වත්කම් 04 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | කාරක සභා 24 ක වසර 4 සිට වසර 30 දක්වා කාල පරාසයක සිට අයවිය යුතු ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එමින් තිබුණු එකතුව රු.16,989,337 ක් වූ ගිණුම් ශේෂයන් 362 ක් අයකර ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීම වෙනුවට ණයගැතියන් ලෙස දක්වා තිබුණි. | තොරතුරු පරීක්ෂා කර බලා අදාළ පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොමැති නම් අනුමැතියක් ලබාගෙන කපා හැරීමට කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර කාලීනව ණය ශේෂ අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, අයකර ගත නොහැකි බව තහවුරු කර ගත හැකි ශේෂයන් විධිමත් අනුමැතියක් යටතේ සුදුසු පරිදි කටයුතු කිරීමත්, අය කර ගත හැකි ශේෂයන් හඳුනාගෙන අයකර ගැනීමත් කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 25 ක වසර 4 සිට වසර 38 දක්වා කාල පරාසයක සිට ගෙවිය යුතු ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.24,048,714 ක් වූ ගිණුම් ශේෂයන් 272 ක් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන සුදුසු පරිදි කටයුතු කිරීම වෙනුවට ණයහිමියන් ලෙස දක්වා තිබුණි. | තොරතුරු පරීක්ෂා කර බලා අදාළ පාර්ශවයන් හඳුනාගෙන ගෙවීම් කිරීමට හෝ එසේ නොහැකි නම් අනුමැතියක් ලබාගෙන ශේෂයන් කපා හැරීමට කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර ගෙවිය යුතු බව තහවුරු කර ගත නොහැකි ශේෂයන් විධිමත් අනුමැතියක් යටතේ සුදුසු පරිදි කටයුතු කල යුතු අතර ගෙවිය යුතු ශේෂයන් හඳුනාගෙන කඩිනමින් ගෙවීම් කල යුතුය. |
| (ඈ) | කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු එකතුව රු.560,903 ක් වූ ස්ථාවර වත්කම්, ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත නොකර පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි වර්ගීකරණයන් සහිතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 03 ක වියදම් ප්‍රතිපූර්ණය කිරීම් රු.1,194,487 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කරන බව. | ආදායම් නිවැරදි හඳුනාගෙන ගිණුම්ගත කල යුතු අතර අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඊ) | රිදීපාන ගොවිජන සේවා කාරක සභාවේ වාණිජ පොහොර වෙළෙඳ ගිණුමේ ආරම්භක ශේෂය | වාණිජ පොහොර වල වෙළෙඳපොළ මිල උච්ඡාවචනය වීම | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 09 අනුව තොග අගය කල |

| | | | |
|---|---|---|---|
| | රු.185,000 ක් වැඩිපුර දක්වා තිබුණි. | හේතුවෙන් මිල ගණන් සංශෝධනය කල බව. | යුතුය. |
| (ඩ) | නාගදීප ගොවිජන සේවා කාරක සභාවේ 2024 වර්ෂය තුලදී පිරිවැය රු.101,100 ක් වූ කල් ඉකුත් වූ බිත්තර වී තොගයක් රු.57,500කට අපහරණය කර, අපහරණය කරන ලද තොගයේ පිරිවැය රු.101,100 ක් ආපසු යැවුම් ලෙසත් කල් ඉකුත් වූ තොග විකුණුම් ආදායම රු.57,500ක් වෙනත් ආදායම් ලෙසත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර අපහරණ අලාභය වූ රු.43,600 මූල්‍ය ප්‍රකාශන තුල ගලපා නොතිබුණි. මේ හේතුවෙන් කාරක සභාවේ අතිරික්තය රු.202,200 කින් වැඩිපුර දක්වා තිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම කළ යුතුය. |
| (ඪ) | කුඹල්වෙල ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර වත්කම් වල ශුද්ධ අගය රු.80,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (එ) | බඹරපාන ගොවි බැංකුවේ පොදු ලෙජරය තුල සමුච්චිත අරමුදල් ගිණුම, බැංකු ආදායම් ගිණුම හා බැංකු වියදම් ගිණුම පමණක් පිළියෙළ කර තිබුණු අතර අනෙකුත් ගිණුම් පිළියෙළ කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් සකස් කරන බව. | පොදු ලෙජරය තුළ සියළු ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | බල්ලකෙටුව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල ස්ථාවර වත්කම්වල සමාලෝචිත වර්ෂය අවසානයේ ශුද්ධ අගය සැලකිල්ලට නොගෙන ආරම්භක පිරිවැය සටහන් කිරීමෙන් ජංගම නොවන වත්කම් ශේෂය රු.103,614 කින් වැඩිපුර දක්වා තිබුණි. | ඉදිරියේදී ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතුය. |
| (ඔ) | මහියංගණය ගොවිජන සේවා කාරක සභාවේ 2024 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.1,820,494 ක් වුවද එය රු.1,217,223 ක් ලෙස රු.603,271 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 | ඉදිරියේදී නිවැරදි ව ගිණුම්ගත කරන බව. | උපචිත පදනම මත ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය. |

දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.129,042 ක් ගිණුම් ගත කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 6 ක ගිණුම් විෂයන් 18 කට අදාළ එකතුව රු.172,162 ක් අනුරූපි වාර්තා වල දක්වා තිබූ ශේෂයන්ට වඩා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කර නිවැරදි කල යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 13 ක ගිණුම් විෂයන් 57කට අදාළ එකතුව රු.11,204,669 ක් අනුරූපි වාර්තා වල දක්වා තිබූ ශේෂයන්ට වඩා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කර නිවැරදි කල යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු නියමු ව්‍යාපෘති 7 ක ගිණුම් විෂයන් 20 කට අදාළ එකතුව රු.1,767,976 ක් අනුරූපි වාර්තා වල දක්වා තිබූ ශේෂයන්ට වඩා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කර නිවැරදි කල යුතුය. |
| (ඈ) | ගොවිජන බැංකු නියමු ව්‍යාපෘති 5 ක ගිණුම් විෂයන් 16 කට අදාළ එකතුව රු.1,126,915 ක් අනුරූපි වාර්තා වල දක්වා තිබූ ශේෂයන්ට වඩා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කර නිවැරදි කල යුතුය. |
| (ඉ) | ඇටම්පිටිය ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුළු වත්කම් හා වගකීම් අතර රු.138,000 ක වෙනසක් පැවතුණි. | වරද හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ සැසඳීම් සිදු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් වගකීම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඊ) | රඹුක්පොත ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියට ගෙවිය යුතු රු.45,165 ක ශේෂය ගොවිජන | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කර නිවැරදි කල යුතුය. |

බැංකුවේ (නියමු ව්‍යාපෘතියේ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 06 ක වර්ෂ 27 - 35 අතර කාලයක සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් හර ශේෂ වටිනාකම රු.544,542 ක්, කාරක සභා 06 ක වර්ෂ 08 - 09 අතර කාලයක සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් බැර ශේෂ වටිනාකම රු.1,323,134 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී එම ශේෂ පිළිබඳව සොයා බලා නිවැරදි කරන බව. | අවිනිශ්චිත ගිණුම් ඇතිවීමට හේතු හඳුනාගෙන නිවැරදි කල යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 18 කට අදාලව එකතුව රු.34,945,037 ක් වූ වත්කම් ශේෂ 75 ක්, කාරක සභා 08 කට අදාළව එකතුව රු.28,999,284 ක් වූ වගකීම් ශේෂ 31 ක් ගොවි බැංකු 02 කට අදාළව එකතුව 19,800,575 ක් වූ පාලන ගිණුම් 18ක් මස්පන්න ගොවි බැංකුවේ එකතුව රු.23,786 ක් වූ වියදම් ශේෂ 02 ක් හා බඹරපාන ගොවි බැංකුවට අදාලව එකතුව රු. 2,755,916 ක් වූ ආදායම්, වියදම් හා පාලන ගිණුම් ශේෂ 14 ක් අදාළ ස්ථාවර වත්කම් ලේඛන, ණයගැති හා ණයහිමි ලේඛන ලෙජර් ගිණුම්, ශේෂ සනාථ කිරීම් සහ අදාළ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සියළු ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මඩොල්සිම ගොවිජන සේවා කාරක සභාවේ 2024 ජනවාරි සිට 2024 සැප්තැම්බර් දක්වා කාලසීමාවට | ගෙවීම් වවුචර් හා සුළු මුදල් පොත ආරක්ෂිතව අසුරා තබා පසුව සොයා ගත් බව | සියළු පොත් පත් ලිපි ලේඛන සකස් කර විගණනය සඳහා |

| | | | |
|---|---|---|---|
| | අදාලව ගෙවීම් වවුචර්, සුළු මුදල් වවුචර් හා සුළු මුදල් පොත සහ විකුණා මුදල් ගෙවීමේ පදනම මත භාණ්ඩ ලබා දීමේ ලේඛණය විගණනයට ඉදිරිපත් නොවුණි. | හා 2024 වර්ෂයේදී වි.මු. ණය නිකුත් කර නොමැති බව. | ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | සපුගොල්ල ගොවිජන සේවා කාරක සභාව සතු බැංකු ජංගම ගිණුමකට අදාලව 2024 දෙසැම්බර් මාසය සඳහා සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂ 8 ක කාල පරිච්ඡේදයක සිට පැවත එන, බැංකු ශේෂයට එකතු කිරීම් රු.56,769 ක් සහ අඩුකිරීම් රු.18,783 ක් ලෙස සිදුකරන ලද ගැලපීම් සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර එම ගැලපීම් හඳුනාගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සියළු ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | **නීතී, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 133 හා 134 | | කාරක සභා 07 ක සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 188 (2) | 56,025 | සපුගොල්ල කාරක සභාව විසින් තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 252,688 | කාරක සභා 03 ක් විසින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | -එම- |
| (iv) | මුදල් රෙගුලාසි 880 | | කාරක සභා 10 ක භාණ්ඩ, මුදල් භාරව කටයුතු කරන නිලධාරීන් 17 ක් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. | කාරක සභා 04 ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 08 ක් විසින් ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කරන බව. | -එම- |
| (v) | මුදල් රෙගුලාසි 891 | | කාරක සභා 14 ක් විසින් ඇප තැන්පත් ලේඛණ පවත්වා ගෙන ගොස් නොතිබුණි. | කාරක සභා 05ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 09 ක් ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | -එම-. |
| **(ආ)** | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ** | | | | |
| (i) | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | 1,417,283 | කාරක සභා 14 ක් විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව ලැබිය යුතු කාමර කුලී අයකර ගෙන නොතිබුණි. | රිදීපාන ගොවිජන සේවා කාරක සභාවට අයවිය යුතු රු. 8,640 ක මුදල ඉදිරියට එන ශේෂයක් බවත් අනෙක් කාරක සභා 13 විසින් ඉදිරියේදී අදාල ආයතන දැනුවත් කර හිඟ කුලී | චක්‍රලේඛ යේ විධිවිධාන පරිදි කටයුතු කර කාමරකුලී අයකරගත යුතු අතර, |

| | | | | |
|---|---|---|---|---|
| | | | අය කර ගන්නා බව. | එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 3.4.9 ඡේදය | සෑම මසක් තුලදීම ණය ලබා දුන් ගොවීන්ගේ නාම ලේඛණයක් ප්‍රධාන කාර්යාලයට පිටපත් සහිතව දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්ට ඊළඟ මාසයේ 15 දිනට පෙර යවා එහි පිටපතක් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රදර්ශනය කල යුතු වුවත් බණ්ඩාරවෙල, දියළුම හා නිකපොත ගොවිජන බැංකු විසින් එලෙස කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (iii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 3.4.11 ඡේදය | පස්සර ගොවිජන බැංකුවෙන් ණය ලබා ගත් ගොවීන් සඳහා ගොවි ආපදා ණය ආවරණ ගිණුමක් පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | -එම- |
| (iv) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (අංක 107 සංශෝධන) දරන චක්‍රලේඛය | දෛනිකව අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවද කාරක සභා 10 ක් විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 428 කදී මුදල් අත රඳවාගෙන තිබුණි. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 03 ක් විසින් මුදල් තැන්පත් කිරීමට යාමට ඇති දුර ප්‍රමාණය 6km ට වඩා වැඩි බැවින් දිනපතා තැන්පත් කිරීම අපහසු වූ බව හා | -එම- |

| | | | |
|---|---|---|---|
| | | | කාරක සභා 06ක් විසින් ප.ව. 3 න් පසු ලද මුදල් පසු දින තැන්පත් කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ සමස්ථ මෙහෙයුම් ප්‍රතිඵලය රු.24,062,390 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.18,455,589 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,606,801ක වර්ධනයක් නිරීක්ෂණය විය.

බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු 30 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ සමස්ථ මෙහෙයුම් අතිරික්තය රු.21,053,901 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවීන් වෙත ලබාදීම සඳහා ගොවිජන සේවා කාරක සභා 09 ක් වෙත ලැබී තිබුණු එම්.ඕ.පී කිලෝග්‍රෑම් 3,936 ක්,ටී.එස්.පී පොහොර කිලෝග්‍රෑම් 4,343 ක්, යූරියා කිලෝග්‍රෑම් 4,018 ක් සහ වෙනත් පොහොර කිලෝග්‍රෑම් 582 ක් කල් ඉකුත් වී ගබඩා තුළ පවතින බව නිරීක්ෂණය විය. | යූරියා ලොකු කැට වීම හේතුවෙන් ගොවීන් විසින් මිලදී නොගන්නා බව හා ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත පැමිණීමේදී දැරීමට සිදු වන ප්‍රවාහන පිරිවැය වඩා ඉහල වීම මත පොහොර රැගෙන යාමට නොපැමිණෙන බව. | කඩිනමින් උපදෙස් ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කාරක සභා 16 ක් විසින් එම කාරක සභාවලට අයත් ඉඩම්වල ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන තිබුණද ඒවායේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ඉල්ලීම් කර ඇති බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන ගොවිජන සේවා කාරක සභා සතු ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | නාගදීප ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිට 2019 වර්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික්කයට ස්ථාන මාරු වී ගිය නිළධාරියෙකුගෙන් | අදාළ මුදල ගෙවන ලෙස නිලධාරියා ලිඛිතව දැනුවත් කර ඇති බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයවිය යුතු රු.93,118 ක ණය ශේෂය 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) | දඹවින්න ගොවිජන සේවා කාරක සභාව විසින් 2008 සැප්තැම්බර් 06 දින සිට වසර 03 ක ගිවිසුම් කාලයක් සඳහා කාරක සභාව සතු රෝද දෙකේ අත් ට්‍රැක්ටරය දිවිතොටවෙල ගොවි සංවිධානයට රු.200,000 ක මුදලකට කුලියට දී තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් රු. 125,000 ක මුදලක් හිඟව තිබුණු අතර එම මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 04 කට අදාළ එකතුව රු. 155,204 ක හිඟ අක්කර බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අය කර ගෙන නොතිබුණි. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | නියමිත කාල සීමාව තුළ අයකර අවසන් කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 04 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 29 දෙනෙකු වෙත විකුණා මුදල් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂය තුල සහ ඊට පෙර වර්ෂයන්හිදී නිකුත් කර තිබුණු ද්‍රව්‍ය/උපකරණ වෙනුවෙන් අයවිය යුතු රු.2,445,984 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව අයකර ගැනීමට කටයුතු ක< යුතු අතර සහන කාලසීමාව ඉක්ම වූ පසු වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 31 ක් සඳහා ශීතකරණ මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට අදාලව මිල දී ගත් එකතුව රු. 8,588,862 ක් වටිනා උපකරණ 123 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ශීතකරණ මෘදුකාංගය ස්ථාපිත කර නොමැති බැවින් උපකරණ භාවිතා කල නොහැකි බව. | ශීතකරණ මෘදුකාංගය ස්ථාපිත කර අදාල උපකරණ භාවිතයට ගත යුතුය. |
| (ආ) | නාගදීප ගොවිජන සේවා කාරක සභාවේ වී සහ බඩ ඉරිඟු නෙලීමේ කටයුතු සඳහා භාවිතා කරන වටිනාකම රු.2,351,000 ක් වූ යන්ත්‍රයක් වසර 09 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් කුඹුරු ඉඩම් සඳහා යන්ත්‍රය භාවිතා කල නොහැකි බව. | භාවිතයට ගත හැකි මධ්‍යස්ථානයක් වෙත ලබා දීමට හෝ ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

### 3.4 කාර්ය මණ්ඩල කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ හා ගොවිජන සේවා කාරක සභා 31 සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 09 කට අදාළ නිලධාරීන් 264 ක ගේ ඌණතාවයක් පැවති අතර තනතුරු 04 කට අදාළව නිලධාරීන් 11 ක ගේ අතිරික්තයක් පැවතුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදු කර පුරප්පාඩු හා අතිරික්ත තාවයකින් තොරව කාර්ය මණ්ඩලය ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගත යුතුයි. |

## 4. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1999 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුල කාරක සභා 29 ක් විසින් ගොවීන් 3,035 කට නිකුත් කරන ලද කෘෂි ණය මුදලින් රු.93,563,983 ක් , කාරක සභා 25 | අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කිරීම, කාර්යාල පරීක්ෂණ පැවැත්වීම සහ දැනුවත් | ණය ලබා දීම් හා කාලීනව ණය අයකර නොගැනීම් පිළිබඳ විධිමත් විමර්ශනයක් සිදු කර අදාළ පාර්ශව වෙත |

ක් විසින් ගොවීන් 669 කට නිකුත් කරන ලද ව්‍යාපෘති ණය මුදලින් රු.34,060,775 ක් හා කාරක සභා 21 ක් විසින් ගොවීන් 478 කට නිකුත් කරන ලද ව්‍යවසායක ණය මුදලින් රු. 14,984,724 ක් හා කාරක සභා 13ක් විසින් ගොවීන් 81 කට නිකුත් කරන ලද කෘෂි උපකරණ සහ වෙනත් ණය මුදලින් රු.3,410,346 ක් ලෙස එකතුව රු.146,019,828 ක් අයකර ගෙන නොතිබුණි.

කිරීම් ලිපි යොමු කිරීම මගින් අයකර ගැනීමට කටයුතු කරන බව.

පියවර ගැනීමටත්, ණය ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.